





## පාළුව

තනිකමක් දැනෙයි මට
හුදෙකලා වූ විටෙක
දඟකාර පුංචි නංගි
ගෙදර අද නැති නිසා

කෙලිදෙලෙන් අප සමග
දුව පනිමින් එහෙට මෙහෙට
පානගපු ඒ මිදුල
නිහඬව ඇත දැනට

දබර වී සිනාසී
ගෙවුණු කාලය මතක් වී
නැගෙයි කඳුළක් නෙතට
මලිතියේ ඔබ ළඟ නැතිව

ආච්චිද හඬයි අප සමග
ඔබේ සුරතල් වදන් මතක් වී
සෙල්ලම් බඩු තබා පිළිවෙලට
ඔබ එතැයි මඟ බලාලා

දඟකාර පුංචි පැංචි
අපෙන් වෙන්වී දුර රටක
අකුරුකරනා බැවින් මව් සමග
දැනෝ පාලුව තදට

මලිතියේ ඔබ හොඳට
ඉගෙන ගෙන සිප්සතර
නැවත අප සමග
එක්වන්නේ කවදා ද?

♦ **නෙතුනි මල්ලවාරච්චි**
*8 ශ්‍රේණිය*
*ශ්‍රී සුමංගල බා. ම. විදුහල*
**පානදුර Sri Lanka**

## Shark මෝරා නම් මත්සයයා



Sharks have been around 400 million years. There are more than 300 species and their teeth are replaced every eight days. A shark sheds up 30,000 teeth in its life-time of 25 years but some can live to 100. Despite their predatory image, only about 30 species are dangerous to humans. There are about 70 shark attacks world wide each year.

**මෝ**රු වසර මිලියන 400ක කාලයක පටන් සිටින දැවැන් ත මත්සයයෝ වෙති. මෝරු වර්ග 300 ක් පමණ සිටිති. දවස් අට කට වරක් උන්ගේ පරණ දත් වැටී අළුත් දත් ලැබේ. වසර 25 ක් වන මෝරාගේ ජීවිත කාලය තුළ දත් 30,000 ක් ගැලවී වැටෙනබව කියති. සමහර මෝරුන් වසර 100 ක් පමණ ජීවත් වන බව සොයාගෙන ඇත. මිනිසුන් ගොදුරු කරගන්නා භයා නක මාළුවෙකු ලෙස මෝරා හැඳින්වුවද මිනී මෝරුන් ඇත්තේ වර්ග 30 ක් පමණි. වසරකට ලොව පුරා මිනී මෝරුන්ගේ ප්‍රහාර 70 ක් පමණ සිදුවන බව ගණන් බලා තිබේ.

♦ *Auntie Ramani ( රමණී නැන්දා )*

## අපේ ගුරුතුමී

සුදුම සුදුයි හරි කරුණාවයි
මුහුණ පුරා උතුරායන සිනාවයි
අකුරු උගන්වයි සිංදු කියාදෙයි
අප හැම ඇයගේ දරුවෝ වගෙයි
පාසැලේදි අපව බලාගනියි
හොඳ නරක කියලා දෙයි
පුතේ දුවේ කියා කතාකරයි
ගුරුතුමී අම්මා කෙනෙක් වගෙයි

♦ **හසනි ශසිකා වනිගරත්න**
**මිරිස්වත්ත මහ විදුහල කළුතර**

**To all little sons & daughters**
**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail.**
**සිසු සිසුවියන්ටයි**
**ඔබේ ලිපි හා කවි තැපෑලෙන් හෝ පැක්ස් මගින් අප වෙත එවන්න**

**BOC ලංකා බැංකුව BANK OF CEYLON**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලන්ඩන් ශාඛාව**

***ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරිමේ මහඟු අවස්ථාවක් !***

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.


* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. **පවුම් වලින්ම පොළිය ලබාගැනීම.**
2. **ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරිමේ හැකියාව.**
3. **NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරිමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.**

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* **HSBC, NATWEST, BARCLAYS** *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරිමේ ගිණුම්වලට මුදල් බැර කිරිමෙන් අනතුරුව අපව අමතන්න.*

**HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624**
**NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732**
**BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859**

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit**




## කරුණාරත්න අබේසේකරයන්ගේ සරස්වතී මණ්ඩපය පාසැල් විශ්වකෝෂය
### සම්පාදක - ෆීලික්ස් ඩී. ප්‍රනාන්දු
*මුද්‍රණය හා ප්‍රකාශනය මල්පියලි ප්‍රකාශකයෝ*




**50, 60, 70** දශකයන් මුළු ලෝකයේ ම සෞන්දර්යය වශයෙන් ප්‍රභාමත් කාලයක් ලෙස ගිණිය හැකියයි මම සිතමි. නවකථා, කෙටිකතා, කාව්‍ය ආදී භාෂා සාහිත්‍ය නිර්මාණ පැත්තෙන්ද, නාට්‍ය, සිනමාව හා සංගීතය පෙරටු වූ ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයෙන්ද ඒ යුගය ඉමහත් අවදිවීමකට ලක් වෙමින් තිබුණු බව මට මතකය. මුළු මහත් යුරෝපයේ පමණක් නොව පෙරදිගද එසේ වීය. අපේ ශ්‍රීලංකාව ද ඊට සමාන වූයේ ය. මේ තත්ව යන් ළමා වයසටද අතිශයින් බලපෑම අපට දැකිය හැක්කේ ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ළමා පිටිය තුළිනි. එකල සිළුමිණ හා ලංකාදීප ආදී ප්‍රධාන පුවත්පත් වල අප රටේ ළමා පෙළ සඳහා විශේෂ පිටු වෙන් කර තිබුණි. අපේ ගුවන් විදුලිය ද ළමයින් වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කළ ආයතනයක් වූයේය.

ඒ ගෙවුණු දශකයන්හි අද මෙන් අප රටේ ටෙලිවිෂනය හෝ පරිගණකය තිබුණේ නැති අතර විනෝදය, දැනුම සමග ලෝක තොරතුරු සැනින් ගෙන ආ එකම මාධ්‍යය වූයේ ගුවන්විදුලියයි. එකල බොහෝ දෙමාපියන් වැඩ ඇරී ගෙදර දුවගෙන ආවේ හවස 5 ට ගුවන් විදුලියේ ස්වදේශීය අංශයෙන් විකාශනය වූ එම ළමා වැඩසටහනට සවන්දීම ටය. එය ළමයින්ගේ පමණක් නොව වැඩිහිටියන්ට ද ගෙන ආ දැනුම් සම්භාරය ඉමහත්ය.

එදා ළමාපිටියේ වැඩසට හන් වලට සහභාගිවූ බොහෝ දරුවෝ පසු කලෙක ලේඛක යන්, කලාකරුවන්, ගායක ගායිකාවන්, දොස්තරවරුන්, ඉන්ජිනේරුවන්, ගුරුවරුන්, දේශපාලනඥයින් ආදී වශයෙන් විවිධ ක්ෂෙත්‍රයන්හි උසස් තත්වයන්ට පත්වූහ. ශ්‍රීලංකාවේ අප දන්නා ප්‍රවීන ගායිකාවන් කීප දෙනෙක් ඒ අතීත ළමා පිටියෙන් පුහුණුව ලැබූ අය වෙති. ලංකා ගුවන් විදුලියේ මුල්ම ළමා පිටිය පැවැත්වීම ආරම්භවුණේ කොළඹ ප්‍රකට කවියෙකුව සිටි යූ ඒ එස් පෙරේරා මහතා (සිරි අයියා) යටතේය. කරුණාරත්න අබේසේකර මහතාද ශිෂ්‍යයෙකු ලෙස ඔහුගේ සොහොයුරන්ද සමග එම ළමා වැඩසටහනට කතා ගෙතීමෙන්, කවි, ගී ගැයීමෙන් දායක වී ඇත.

සිරි අයියාගෙන් පසු ළමා පිටිය මෙහෙයවීම පැවරුණේ කරු අයියාට හෙවත් කරුණාරත්න අබේසේකරයන්ටය. එම වැඩ සටහන **සරස්වතී මණ්ඩපය** නමින් නම් කළේ ඔහුය. සරස්වතී මණ්ඩපය කරු අයියාගේ අභාවය තෙක් දිගටම පැවතුණ අතර ඉන් ශ්‍රී ලංකාවේ ළමා පරපුරට අත්වූ සෙත ඉමහත්ය. ළමයින් පාදක කොට වැඩසටහන්, ළමා ගී, ළමා නාට්‍ය, ළමා චිත්‍රපට ආදිය අප රටේ තැනෙන්නට මං පැදුණේ ඒ ළමාපිටියෙන් ඇතිවූ උනන්දුවෙනි.

සරස්වතී මණ්ඩපයේ එකල භාවිතා කළ නොයෙක් වැඩසටහන් සඳහා තමා ලියූ පිටපත් රාශියක් එකතු කර දැනුම මිණුම වඩවන පොතක් වශයෙන් **කරුණාරත්න අබේසේකරයන්ගේ සරස්වතී මණ්ඩපය** යන නමින් නොබෝදා ප්‍රකාශයට පත්වී ඇත. එහි සම්පාදකවරයා වන ගම්පහ ෆීලික්ස් ඩී. ප්‍රනාන්දු මහතා කාලයක් ම කරුණාරත්න අබේසේකර මහතාගේ ශිෂ්‍යයෙකු වශයෙන්ද, එම ළමා වැඩසටහන් වලට කරුණු එක් රැස් කළ, ඒවාට සහභාගි වූ විද්වත් ලේඛකයෙකු වශයෙන්ද, ගුවන්විදුලි ශිල්පියෙකු ලෙසද මනා පරිචයක් ලත් අයෙකි. එමෙන්ම ඔහු අද නිර්මාණශීලී කවියෙකු වශයෙන්ද ප්‍රකට ය.

ෆීලික්ස් මෙම **සරස්වතී මණ්ඩපය පාසැල් විශ්වකෝෂය** පළකර ඇත්තේ සිය ගුරුන් වන කරුණාරත්න අබේසේකරයන්ට උපහාරයක් වශයෙනි. කුඩාදරුවන්ගේ දැනුම මිණුම වඩවන අටියෙන් සකසා ඇති මෙම මාහැඟි ග්‍රන්ථය පාසැල් පොතක් වශයෙන්ද භාවිතයට සුදුසු යි අපට හැඟේ. පොත අවශ්‍ය අයට පහත සඳහන් ලිපිනයෙන් එය ගෙන්වා ගත හැකිය.

**ෆීලික්ස් ඩී. ප්‍රනාන්දු**
**අංක 28935/9**
**නිස්සංක වලව්ව, යක්කල**
**දුරකථනය 033 4902070**

**- වෙනුර**

## අවමංගල්‍ය Obituary
## කල්‍යාණි ගුණපාල මහත්මිය



**කෑ**ගල්ල බුළුරුප්පේ පදිංචිව සිටි විශ්‍රාමලත් පාඨශාලාචාරිණී කල්‍යාණි ගුණපාල මහත්මිය වසර **81** ක් ආයු වළඳා පසුගිය සැප්තැම්බර් **8** වන දින පරලෝසැපත් වූවා ය.

පුරා වසර **35** කට ආසන්න කාලයක් කීර්තිමත් ගුරු මාතාවක් ලෙස දිවයින පුරා පාසැල් කීපයක සේවය කළ ඇය වැඩි කාලයක් ගුරු වෘත්තියෙහි යෙදුණේ හෙට්ටිමුල්ල බණ්ඩාරනායක මහා විද්‍යාලයේ ය.

කෑගල්ල හෙට්ටිමුල්ලේ පදිංචි, විශ්‍රාම ලත් මාණ්ඩලික අධ්‍යාපන නිලධාරී එස්. ගුණපාල මහතාගේ ප්‍රියාදර භාර්යාව වූ ඇය, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් එස්. ජී. විජයබන්දු, එංගලන්තයේ ලෙච්වර්ත්හි පදිංචි එස්. එල්. සෙනෙහෙධීර, පාඨශාලාචාර්‍ය දීපාල් ධර්මප්‍රිය සහ හෝමාගම පදිංචි ශ්‍රියානි ප්‍රියංකර යන සොයුරු සොයුරියන්ගේ ආදරණීය මෑණියන් වූවා ය.

අවසන් කටයුතු සැප්තැම්බර් **11** වන දින කෑගල්ල පොදු ආදාහනාගාරයේදී පැවැත්විණ.

**කල්‍යාණි ගුණපාල මහත්මියට උතුම් වූ නිවන් සුව ප්‍රාර්ථනා කරමු !**